# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය - නර්තන හා නාට්‍ය කලා පීඨය
# නාට්‍ය, මුද්‍රානාට්‍ය හා නූතන නර්තන අධ්‍යයනාංශය

## <u>උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමේ</u>
## <u>යෝග්‍යතා පරීක්ෂණය - 2024</u>

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නාට්‍ය, මුද්‍රානාට්‍ය හා නූතන නර්තන අධ්‍යයනාංශයෙහි ප්‍රධාන උපාධි පාඨමාලා 03 ක් ක්‍රියාත්මක වේ. **(01) රූපණය, (02) නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය,** හා **(03) මුද්‍රානාට්‍ය හා නූතන නර්තනය** එම පාඨමාලා වේ. උසස් පෙළ නාට්‍ය හා රංග කලාව විෂය හදාරා ඇති අපේක්ෂකයන්ට රූපණය සහ නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය යන පාඨමාලා දෙකට ම අයදුම් කළ හැකි අතර මුද්‍රානාට්‍ය හා නූතන නර්තන පාඨමාලාවට අයදුම් කළ හැක්කේ උසස් පෙළ නාට්‍ය හා රංග කලාව සහ නර්තනය යන විෂයයන් ද්විත්වය ම හැදෑරූ අපේක්ෂකයන්ට පමණි. අපේක්ෂකයන්ට තමන්ට අභිමත පාඨමාලා සඳහා අයදුම් කළ හැකි අතර, ඉහත සඳහන් පාඨමාලා ත්‍රිත්වයට ම අයදුම් කර පෙනී සිටියහොත්, අපේක්ෂකයා විසින් වැඩි පරිසාධිතබවක් පෙන්නුම් කරන ලද විෂය මාලාව සඳහා ඇය/ඔහු තෝරාගනු ලැබේ.

- **යෝග්‍යතා පරීක්ෂණයේ ස්වභාවය කෙබඳුද?**

මෙම යෝග්‍යතා පරීක්ෂණය, ඉහත සඳහන් උපාධි පාඨමාලා අරමුණු කරගත් **ලිඛිත පරීක්ෂණයකින්, ප්‍රායෝගික පරීක්ෂණයකින් සහ සහතික පත්‍ර ඇගයීමකින්** සමන්විතය. ලිඛිත පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය දින දෙකක දී පැවැත්වෙන අතර සහතික පත්‍ර පරීක්ෂාව තමන්ට අදාළ ප්‍රායෝගික පරීක්ෂණ දිනයේ දී ම සිදු වේ.

එක් එක් පාඨමාලා සඳහා නිර්දේශිත පරීක්ෂණ පහත දැක්වේ.

- **රූපණය සහ/හෝ නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය පාඨමාලා සඳහා පමණක් අයදුම් කරන අපේක්ෂකයින් ඉදිරිපත් විය යුතු පරීක්ෂණ මොනවාද?**

| රූපණය හෝ නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය උපාධි පාඨමාලව සඳහා පමණක් ඉදිරිපත් වන්නන් | විස්තරය | ලබා දෙන ලකුණු |
|---|---|---|
| ලිඛිත පරීක්ෂණය | නිර්මාණාත්මක රචනය, නාට්‍ය අධ්‍යක්ෂණය, නාට්‍යමය සිද්ධි ගොඩනැගීම හා දෙබස් රචනය සහ විචාරාත්මක රචනය යන අංශ පිළිබඳව අපේක්ෂකයාගේ කුසලතාව සහ දැනුම මෙහිදී පරීක්ෂාවට ලක් කෙරේ.<br><br>මෙය පැය 1 මිනිත්තු 30 ක ලිඛිත පරීක්ෂණයකි. අපේක්ෂකයා කොටස් 03 ක් යටතේ පිළිතුරු සැපයිය යුතු වේ. පළමු හා දෙවන කොටස සඳහා ලකුණු 15 ක් බැගින්ද, තෙවන කොටස සඳහා ලකුණු 10 ක් ද හිමි වේ. | 40% |
| ප්‍රායෝගික පරීක්ෂණයː 01<br><br>අභිලාෂය ප්‍රකාශය | අපේක්ෂකයාගේ නම හා විශ්වවිද්‍යාලය විසින් ලබා දෙන ලියාපදිංචි අංකය පළමුව වාචිකව සඳහන් කළ යුතුය.<br><br>මෙහිදී අපේක්ෂිත පාඨමාලාව සඳහා ඔබව තෝරාගැනීමට වඩාත් සුදුසු වන්නේ කවර හේතූන් නිසාද යන්න වාචික ව පෙළ ගැස්වීම අපේක්ෂා කෙරේ. (එහිදී ඔබගේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති පළපුරුද්ද හා නිපුණතා හෝ නිර්මාණ අත්දැකීම්ද අදාළ කරගත හැකිය) | 5% |
| ප්‍රායෝගික පරීක්ෂණයː 02<br><br>ඒකල භාෂණය | නිර්දේශ කරනු ලබන කේවල භාෂීය / ඒකල භාෂීය නාට්‍ය පිටපත් කොටස් හයෙන් එකක් (01) පමණක් තෝරාගෙන එය රූපණය සමඟින් ඉදිරිපත් කළ යුතුය.<br><br>ලබාදෙන පිටපත ඒකල භාෂණයක් ලෙස ගොඩනැගීම, කටහඬ ප්‍රක්ෂේපණය හා හැසිරවීම, උචිත භාවාර්ථ දැනවීම හා අංග ප්‍රත්‍යාංග භාවිතය ආදි රූපණ හැකියාව මෙහිදී ඇගයීමට අපේක්ෂා කෙරේ.<br><br>(මෙම ලේඛනය අවසානයේ නිර්දේශිත ඒකල භාෂණ අමුණා ඇත) | 20% |
| ප්‍රායෝගික පරීක්ෂණයː 03<br><br>එසැණ නිරූපණය | ප්‍රායෝගික පරීක්ෂක මණ්ඩලය විසින් ඔබ වෙත සපයනු ලබන නාටකීය අවස්ථාව තෝරා ගනිමින් එසැණ නිරූපණයක් ඉදිරිපත් කළ යුතුය.<br><br>ක්ෂණික නිරූපණයෙහි නාට්‍ය මාධ්‍යය භාවිතය, නිර්මාණාත්මක බව, සිදුවීම් පෙළගැස්ම සහ රංගන කුසලතාව මෙහිදී ඇගයීමට ලක් කෙරේ. | 15% |
| ප්‍රායෝගික පරීක්ෂණයː 04<br><br>නාට්‍ය ගීතය | අපේක්ෂකයාට අභිමත නාට්‍ය ගීතයක් තෝරාගෙන උචිත රූපණයද සමඟින් ඉදිරිපත් කළ යුතුය.<br><br>(ඒ සඳහා සංගීතය විශ්වවිද්‍යාලයේ සහය වාදකවරුන් විසින් | 10% |

| | | |
|---|---|---|
| | සපයනු ලැබේ. නැතහොත් ඒ සඳහා අනුවාදනයක් Pen drive එකක රැගෙන ආ යුතුය.)<br><br>මෙම ඇගයීමේදී අපේක්ෂකයාගේ ගායන හැකියාව, ගායන සමඟින් රූපණ හැකියාව ශාරීරික රිද්මය පිළිබඳ කුසලතා ඇගයීමට ලක් කෙරේ. | |
| සහතික පත්‍ර ඇගයීම | මෙම පරීක්ෂණය සඳහා තමන් විසින් ලබා ගෙන ඇති ජාතික හෝ/හා ජාත්‍යන්තර මට්ටමේ සහතික පදක්කම්, සම්මාන හා ප්‍රශංසාත්මක ලිපි ඉදිරිපත් කළ යුතු අතර, තමන් සහභාගි වී ඇති නාට්‍ය නිෂ්පාදන, නර්තන ප්‍රසංග ආදී ක්‍රියාකාරකම්වල ඡායාරූප 10 කින් යුත් ගොනුවක් ද (Portfolio) ඉදිරිපත් කළ යුතු වේ.<br><br>(මේ සඳහා ලකුණු ලබා දෙන ආකාරය මෙම ලේඛනයේ අවසානයේ දැක්වේ) | 10% |
| | **මුළු ලකුණු** | **100%** |

- **මුද්‍රානාට්‍ය හා නූතන නර්තනය පාඨමාලාව සඳහා පමණක් අයදුම් කරන අපේක්ෂකයින් ඉදිරිපත් විය යුතු පරීක්ෂණ මොනවාද?**

| මුද්‍රානාට්‍ය හා නූතන නර්තනය උපාධි පාඨමාලව සඳහා පමණක් ඉදිරිපත් වන්නන් | විස්තරය | ලබා දෙන ලකුණු |
|---|---|---|
| ලිඛිත පරීක්ෂණය | නිර්මාණාත්මක රචනය, නාට්‍ය අධ්‍යක්ෂණය, නාට්‍යමය සිද්ධි ගොඩනැගීම හා දෙබස් රචනය සහ විචාරාත්මක රචනය යන අංශ පිළිබඳව අපේක්ෂකයාගේ කුසලතාව සහ දැනුම මෙහිදී පරීක්ෂාවට ලක් කෙරේ.<br><br>මෙය පැය 1 මිනිත්තු 30 ක ලිඛිත පරීක්ෂණයකි. අපේක්ෂකයා කොටස් 03 ක් යටතේ පිළිතුරු සැපයිය යුතු වේ. පළමු හා දෙවන කොටස සඳහා ලකුණු 15 ක් බැගින්ද, තෙවන කොටස සඳහා ලකුණු 10 ක් ද හිමි වේ. | 40% |
| ප්‍රායෝගික පරීක්ෂණයː 01<br><br>අභිලාෂය ප්‍රකාශය | අපේක්ෂකයාගේ නම හා විශ්වවිද්‍යාලය විසින් ලබා දෙන ලියාපදිංචි අංකය පළමුව වාචිකව සඳහන් කළ යුතුය.<br><br>මෙහිදී අපේක්ෂිත පාඨමාලාව සඳහා ඔබව තෝරාගැනීමට වඩාත් සුදුසු වන්නේ කවර හේතූන් නිසාද යන්න වාචිකව පෙළ ගැස්වීම අපේක්ෂා කෙරේ. (එහිදී ඔබගේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති පළපුරුද්ද හා නිපුණතා හෝ නිර්මාණ අත්දැකීම්ද අදාළ කරගත හැකිය) | 5% |
| ප්‍රායෝගික පරීක්ෂණයː 02<br><br>නර්තනාංගය | අපේක්ෂකයා විසින් පුහුණු වූ මුද්‍රානාට්‍ය හෝ නව නිර්මාණ නර්තන ඛණ්ඩයක් මේ සඳහා ඉදිරිපත් කළ යුතුය.<br><br>මෙම ඉදිරිපත් කිරීමට මුද්‍රා නාට්‍යයට අමතරව බටහිර බැලේ (ballet), නිදහස් චලන නර්තන (freestyle movement dance), ජන නැටුමක්, ශාන්තිකර්ම නර්තනයක්, සංගීතානුසාරී රංගවින්‍යාසයක් (musical choreography) යනාදී ඕනෑම ශෛලියක ආභාසය ලබා ගත හැකිය.<br><br>(නර්තනයට අදාළ සංගීතය හෝ වාදනය ඔබගේ අභිමතය පරිදි සපයා ගත යුතු අතර එම වාදනය Pen drive එකක රැගෙන ආ යුතුය)<br><br>නර්තන හැකියාව, ශාරීරික හැඩතල හා චලනයන්හි උචිත බව, තාල/රිද්ම නිරූපණය, භාව නිරූපණය, විශේෂ කුෂලතා, හා සමස්ත ප්‍රාසංගික බව යනාදිය මෙහිදී ඇගයීමට අපේක්ෂා කෙරේ. | 20% |
| ප්‍රායෝගික පරීක්ෂණයː 03 | නිර්දේශ කරනු ලබන කේවල භාෂීය/ඒකල භාෂීය නාට්‍ය පිටපත් කොටස් හයෙන් එකක් (01) පමණක් තෝරාගෙන එය රූපණය සමඟින් ඉදිරිපත් කළ යුතුය. | 10% |

| | | |
|---|---|---|
| ඒකල භාෂණය | ලබාදෙන පිටපත ඒකල භාෂණයක් ලෙස ගොඩනැගීම, කටහඬ ප්‍රක්ෂේපණය හා හැසිරවීම, උචිත භාවාර්ථ දැනවීම හා අංග ප්‍රත්‍යාංග භාවිතය ආදි රූපණ හැකියාව මෙහිදී ඇගයීමට අපේක්ෂා කෙරේ.<br><br>(මෙම ලේඛනයේ අවසානයේ නිර්දේශිත එකල භාෂණ අමුණා ඇත) | |
| ප්‍රායෝගික පරීක්ෂණයඃ 04<br><br>එසැණ නර්තනය | ප්‍රායෝගික පරීක්ෂක මණ්ඩලය විසින් ඔබ වෙත සපයනු ලබන නාටකීය අවස්ථාවක් කේන්ද්‍ර කර ගනිමින් එසැණ නර්තනයක් ඉදිරිපත් කළ යුතුය.<br><br>(මේ සඳහා සංගීතය පරීක්ෂක මණ්ඩලය විසින් සපයනු ලැබේ)<br><br>එසැණ නර්තනයෙහි නිර්මාණාත්මක බව, නර්තනය ඇසුරින් සිදුවීම් ඉදිරිපත් කිරීම, සහ නර්තන කුසලතාව මෙහිදී ඇගයීමට ලක් කෙරේ. | 15% |
| සහතික පත්‍ර ඇගයීම | මෙම පරීක්ෂණය සඳහා තමන් විසින් ලබා ගෙන ඇති ජාතික හෝ/හා ජාත්‍යන්තර මට්ටමේ සහතික පදක්කම්, සම්මාන හා ප්‍රශංසාත්මක ලිපි ඉදිරිපත් කළ යුතු අතර, තමන් සහභාගි වී ඇති නාට්‍ය නිෂ්පාදන, නර්තන ප්‍රසංග ආදී ක්‍රියාකාරකම්වල ඡායාරූප 10 කින් යුත් ගොනුවක් ද (Portfolio) ඉදිරිපත් කළ යුතු වේ.<br><br>(මේ සඳහා ලකුණු ලබා දෙන ආකාරය මෙම ලේඛනයේ අවසානයේ දැක්වේ) | 10% |
| | **මුළු ලකුණු** | **100%** |

- **රූපණය, නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය සහ/හෝ මුද්‍රා නාට්‍ය හා නූතන නර්තනය යන පාඨමාලා ත්‍රිත්වයම සඳහා අයදුම් කරන අපේක්ෂකයින් ඉදිරිපත් විය යුතු පරීක්ෂණ මොනවාද?**

| රූපණය, නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය සහ/හෝ මුද්‍රා නාට්‍ය හා නූතන නර්තනය යන පාඨමාලා ත්‍රිත්වයම සඳහා ඉදිරිපත් වන්නන් | විස්තරය | ලබාදෙන ලකුණු |
|---|---|---|
| ලිඛිත පරීක්ෂණය | නිර්මාණාත්මක රචනය, නාට්‍ය අධ්‍යක්ෂණය, නාට්‍යමය සිද්ධි ගොඩනැගීම හා දෙබස් රචනය සහ විචාරාත්මක රචනය යන අංශ පිළිබඳව අපේක්ෂකයාගේ කුසලතාව සහ දැනුම මෙහිදී පරීක්ෂාවට ලක් කෙරේ.<br><br>මෙය පැය 1 මිනිත්තු 30 ක ලිඛිත පරීක්ෂණයකි. අපේක්ෂකයා කොටස් 03 ක් යටතේ පිළිතුරු සැපයිය යුතු වේ. පළමු හා දෙවන කොටස සඳහා ලකුණු 15 ක් බැගින්ද, තෙවන කොටස සඳහා ලකුණු 10 ක් ද හිමි වේ. | 40% |
| ප්‍රායෝගික පරීක්ෂණය: 01<br><br>අභිලාෂය ප්‍රකාශය | අපේක්ෂකයාගේ නම හා විශ්වවිද්‍යාලය විසින් ලබා දෙන ලියාපදිංචි අංකය පළමුව වාචිකව සඳහන් කළ යුතුය.<br><br>මෙහිදී අපේක්ෂිත පාඨමාලාව සඳහා ඔබව තෝරාගැනීමට වඩාත් සුදුසු වන්නේ කවර හේතුන් නිසාද යන්න වාචිකව පෙළ ගැස්වීම අපේක්ෂා කෙරේ. (එහිදී ඔබගේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති පළපුරුද්ද හා නිපුණතා හෝ නිර්මාණ අත්දැකීම්ද අදාළ කරගත හැකිය) | 5% |
| ප්‍රායෝගික පරීක්ෂණය: 02.1<br><br>ඒකල භාෂණය | නිර්දේශ කරනු ලබන කේවල භාෂීය/ඒකල භාෂීය නාට්‍ය පිටපත් කොටස් හයෙන් එකක් (01) පමණක් තෝරාගෙන එය රූපණය සමඟින් ඉදිරිපත් කළ යුතුය.<br><br>ලබාදෙන පිටපත ඒකල භාෂණයක් ලෙස ගොඩනැගීම, කටහඬ ප්‍රක්ෂේපණය හා හැසිරවීම, උචිත භාවාර්ථ දැනවීම හා අංග ප්‍රත්‍යාංග භාවිතය ආදි රූපණ හැකියාව මෙහිදී ඇගයීමට අපේක්ෂා කෙරේ.<br><br>(මෙම ලේඛනයේ අවසානයේ නිර්දේශිත එකල භාෂණ අමුණා ඇත) | 20%<br><br>(මෙම කොටස් දෙකම අනිවාර්ය ඉදිරිපත් කිරීම් වන අතර මෙම ඉදිරිපත් කිරීම් දෙකෙන් වඩාත් පරිසාධිත මට්ටමක් නිරූපණය කරන අංගය සඳහා ලකුණු හිමි වේ.) |
| ප්‍රායෝගික පරීක්ෂණය: 02.1<br><br>නර්තනාංගය | අපේක්ෂකයා විසින් පුහුණු වූ මුද්‍රා නාට්‍ය හෝ නව නිරිමාණ නර්තන ඛණ්ඩයක් මේ සඳහා ඉදිරිපත් කළ යුතුය.<br><br>මෙම ඉදිරිපත් කිරීමට මුද්‍රා නාට්‍යයට අමතරව බටහිර බැලේ (Ballet), නිදහස් චලන නර්තන (Freestyle movement dance), ජන නැටුමක්, ශාන්තිකර්ම නර්තනයක්, සංගීතානුසාරී රංගවින්‍යාසයක් (Musical choreography) යනාදී ඕනෑම ශෛලියක ආභාසය ලබා ගත හැකිය. | |

| | | |
|---|---|---|
| | (නර්තනයට අදාළ සංගීතය හෝ වාදනය ඔබගේ අභිමතය පරිදි සපයා ගත යුතු අතර එම වාදනය Pen drive එකක රැගෙන ආ යුතුය.)<br><br>නර්තන හැකියාව, ශාරීරික හැඩතල හා චලනයන්හි උචිත බව, තාල/රිද්ම නිරූපණය, භාව නිරූපණය, විශේෂ කුෂලතා, හා සමස්ත ප්‍රාසංගික බව යනාදිය මෙහිදී ඇගයීමට අපේක්ෂා කෙරේ. | |
| ප්‍රායෝගික පරීක්ෂණය: 03<br><br>එසැණ නිරූපණයක්<br><br>**හෝ**<br><br>එසැණ නර්තනයක් | ප්‍රායෝගික පරීක්ෂක මණ්ඩලය විසින් ඔබ වෙත සපයනු ලබන නාටකීය අවස්ථාව කේන්ද්‍ර කර ගනිමින් එසැණ නිරූපණයක් ඉදිරිපත් කළ යුතුය.<br><br>ක්ෂණික නිරූපණයෙහි නාට්‍ය මාධ්‍යය භාවිතය, නිර්මාණාත්මක බව, සිදුවීම් පෙළගැස්ම සහ රංගන කුසලතාව මෙහිදී ඇගයීමට ලක් කෙරේ.<br><br>**හෝ**<br><br>ප්‍රායෝගික පරීක්ෂක මණ්ඩලය විසින් ඔබ වෙත සපයනු ලබන නාටකීය අවස්ථාවක් කේන්ද්‍ර කර ගනිමින් එසැණ නර්තනයක් ඉදිරිපත් කළ යුතුය.<br><br>(මේ සඳහා සංගීතය පරීක්ෂක මණ්ඩලය විසින් සපයනු ලැබේ)<br><br>එසැණ නර්තනයෙහි නිර්මාණාත්මක බව, නර්තනය ඇසුරින් සිදුවීම් ඉදිරිපත් කිරීම, සහ නර්තන කුසලතාව මෙහිදී ඇගයීමට ලක් කෙරේ. | 15% |
| ප්‍රායෝගික පරීක්ෂණය: 04<br><br>නාට්‍ය ගීතය | අපේක්ෂකයාට අභිමත නාට්‍ය ගීතයක් තෝරාගෙන උචිත රූපණයද සමඟින් ඉදිරිපත් කළ යුතුය.<br><br>(ඒ සඳහා සංගීතය විශ්වවිද්‍යාලයේ සහය වාදකවරුන් විසින් සපයනු ලැබේ. නැතහොත් ඒ සඳහා අනුවාදනයක් Pen drive එකක ආ යුතුය.)<br><br>මෙම ඇගයීමේදී අපේක්ෂකයාගේ ගායන හැකියාව, ගායන සමඟින් රූපණ හැකියාව ශාරීරික රිද්මය පිළිබඳ කුසලතා ඇගයීමට ලක් කෙරේ. | 10% |
| සහතික පත්‍ර ඇගයීම | මෙම පරීක්ෂණය සඳහා තමන් විසින් ලබා ගෙන ඇති ජාතික හෝ/හා ජාත්‍යන්තර මට්ටමේ සහතික පදක්කම්, සම්මාන හා ප්‍රශංසාත්මක ලිපි ඉදිරිපත් කළ යුතු අතර, තමන් සහභාගි වී ඇති නාට්‍ය නිෂ්පාදන, නර්තන ප්‍රසංග ආදී ක්‍රියාකාරකම්වල ඡායාරූප 10 කින් යුත් ගොනුවක් ද (Portfolio) ඉදිරිපත් කළ යුතු වේ.<br><br>(මේ සඳහා ලකුණු ලබා දෙන ආකාරය මෙම ලේඛනයේ අවසානයේ දැක්වේ) | 10% |
| | **මුළු ලකුණු** | **100%** |

- **පරීක්ෂක මණ්ඩලයේ ලකුණු ගණනය වන්නේ කෙසේද?**

මෙම අභියෝගතා පරීක්ෂණයේ පරීක්ෂක මණ්ඩලය, අභ්‍යන්තර කථිකාචාර්යවරුන්, බාහිර කථිකාචාර්යවරුන් සහ විෂය ප්‍රවීණයන්ගෙන් සමන්විතය. අපේක්ෂක අපේක්ෂිකාවන්ට ලකුණු ප්‍රධානය කෙරෙන්නේ අදාළ පරීක්ෂණයේ එක් එක් කොටස් සඳහා පිරිනමන ලකුණුවල එකතුවක් ලෙසය.

- **ඔබ යෝග්‍යතා පරීක්ෂණය සඳහා සූදානම් වීමේදී සැලකිය යුතු වෙනත් කරුණු මොනවාද?**

  - ඔබගේ ඉදිරිපත් කිරීම් නිසි ලෙස පුහුණු කළ යුතුය.
  - ඔබට ලබා දී ඇති නාට්‍ය පෙළ සහ ගීත ආදිය තම **මතකයෙන් ඉදිරිපත් කළ යුතුය.**
  - ඔබේ රංගය සඳහා රංග වස්ත්‍ර හා අංගරචනා අපේක්ෂා නොකෙරේ. පහත පෙන්වා දී ඇති ආකාරයේ කළු හෝ තද පැහැති පුහුණු ඇඳුමක් පමණක් ප්‍රමාණවත් වේ.



  - රංගයට අත්‍යාවශ්‍ය නම් පමණක් සරල රංග භාණ්ඩයක් භාවිත කළ හැකිය.

- **පරීක්ෂණයෙන් ප්‍රතික්ෂේප වීමට හෝ ඇගයීම අත්හිටුවීමට හේතු මොනවාද ?**

  - අයදුම් කරන්නා වෙනුවට ව්‍යාජ ලෙස වෙනත් අයෙකු පෙනී සිටීම.
  - නිර්දේශිත ඇගයීම් කණ්ඩ සඳහා නිසි ලෙස සූදානම් වී නොමැති වීම.

**ඔබේ යෝග්‍යතා පරීක්ෂණය පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගැනීමට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසෙන්න: https://vpa.**

## ප්‍රායෝගික පරීක්ෂණය සඳහා නිර්දේශිත ඒකල භාෂණ

**නිර්දේශ කරනු ලබන කේවල භාෂිය / ඒකල භාෂිය නාට්‍ය පිටපත් කොටස් හයෙන් එකක් (01) පමණක් තෝරාගෙන එය රූපණය සමඟින් ඉදිරිපත් කළ යුතුය.**

**චරිතයඃ ෂේන්-ටෙ (ගැහැණු)**
**නාට්‍යයඃ බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ගේ *'The Good Woman of Setzuan'***
**පරිවර්තනය ඃ 'සෙට්සුවානයේ සත්‍යාංගනාවී' විජිත ගුණරත්න**

(ෂෙන්ටෙ බත් බන්දේසියක් සමඟ, පහළ වීදියෙන් මතුවෙයි.)

ෂෙන්ටෙ ඃ (ප්‍රේක්ෂකයින්ට) හිමිදිරි පාන්දර සෙට්සුවාන් නගරය දකින කොට කොයි තරම් ආනන්ද ජනකද? මම පුරුදුවෙලා හිටියේ, මගේ කිලිටි බැලැන්කට් එකෙන් ඔළුවත් එක්ක වහගෙන, පස්සට ඉර පායන කං නිදා ගන්න. අද උදේ මම දැක්ක පත්තර බෙදන පුංචි කොළුවා, පාර පිහිදාන ශක්තිමත් මිනිස්සු, අළුත් එළවළු ජාති කරත්ත පිටින් නගරයට එන හැටි. යන් ෂුන් ඉන්න තැන ඉඳලා මෙතෙන්ට සෑහෙන දුරක් තිබිලත්, මට ඒක ඇඟට දැනුනෙ නැහැ. තියන තියන පියවරක් ගණනේ මට දැනුනේ හරිම සැහැල්ලුවක්. ඒ අය කියන්නේ "ෂෙන්ටෙඃ උඹ ආදරයෙන් බැඳිලා ඉන්නවා නම් අහසේ උනත් ඇවිදින්න පුළුවන්." කියලා. හැබැයි ඊට වැඩිය නම් හොඳයි, ගල් බොරළු පොලවක ඇවිදින එක. හිමිදිරි පාන්දරට අර පරණ නගරය පේන්නේ, හරියට ලට්ට ලොට්ට ගොඩක් වගේ. ඒ උනත්, යංතමට එළිය වැටෙන්න පටන් ගත්තම තමයි, ලස්සන මතුවෙන්න පටන් ගන්නේ. ලාවට මීදුම පැතිරිලා තියෙන කොට මතක් වෙන්නේ, වේල් එකෙන් මුහුණ වැහුණ මනමාළියක්.... ඇත්තටම දූවිල්ලෙන් අහස පිරෙන්න කලියෙන්, කොච්චර අපූරුද...? අහලා තියෙනවද පුරාණ කවියෝ කියලා තියෙන දෙයක්? "උඹලා කොයිතරම් අවාසනාවන්තද, කවමදාවත් දැකලා නැත්නම් නගරයක් නින්දෙන් අවදිවෙන හැටි. ඒක හරියට, ප්‍රතිභා සම්පන්න මහළු කැටයම් ශිල්පියෙක්, කැටයමක් කපන්න සූදානමින් මෙවලම් අතට ගන්න කලින් පෙනහැල්ල පිරෙන්න හුස්ම ගන්නවා වගෙයි." (ෂෙන්ටෙ තමා අපේක්ෂාවෙන් බලා සිටින පිරිස දෙසට, සතුටින් පිරි මුහුණින් යුතුව හැරෙයි.) සුභ උදෑසනක්! මම ගෙනාව ඔය හැමදෙනාටම බත්. (ඇය පිරිසට ආචාර කරයි.) චොං, සුභ උදෑසනක්! මම අද හරිම සැහැල්ලුවෙන් ඉන්නේ. මම වීදියේ එන කොට, හැම වීදුරු රාමුවකින්ම මගේ හැඩ බලා ගත්තා. ඔය කාට උනත් ආදරේ හිතෙන ලස්සනක් තියෙනවා මගේ ළඟ. හොඳයි නැද්ද?

**චරිතය : බඟී (ගැහැණු)**

**නාට්‍යයඃ ධනංජය කරුණාරත්න ගේ *'වැලන්ටයින් එනකල්'***

බඟීඃ අපි අසල්වැසියෝ. පුංචි කාලේ ඉඳන් මම එයාට ජෝ කියලා කියන්නේ. ඒකට හේතුව අවුරුදු තුනක වගේ කාලේ දී එයා ගේ තිබුණ වතුර පිස්තෝලයකින් මට වතුර ඉහිනවා ජෝ ඉහිනවා. ඉතිං මම ජෝ කීවා. ඒක දිගටම පුරුද්දට ගියා. මගේ නම භාග්‍යා. ඒ වුනාට ජෝ මට කියන්නේ බඟී කියලා. මොකද පුංචි කාලේ එයාට භාග්‍යා කියලා හරියට කියාගන්ඩ බෑ. බලන්ඩ ඒකත් දිගටම පුරුද්දකට ගිය හැටි. ජෝත් මගේ වයසෙමයි..... ඉතින් අපි හැදුණේ වැඩුණේ එකට. සෙල්ලම් කරන්ඩ අපිට වෙන කවුරු වත් අවශ්‍ය වුණේ නෑ. අපිට බෙදාගන්ඩ බැරි කිසිම දෙයක් තිබුණේ නෑ. අපි කොයිතරම් සමීප ව හිටිය ද කියනවා නම් අපි දෙන්න ගේ ගෑනිය කවුද පිරිමියා කවුද කියන එක පවා පැටලිලා තිබුණේ. හැබැයි ඒ සිඟිති කාලේ එය කොයි සෙල්ලමටත් වඩා අපි ගොඩක් ආසා කරපු එක මහ පුදුම සෙල්ලමක් තිබුණ. ඔන්න අපි දෙන්න හැංගි මුත්තං කරන ගමන් යනවා කවුරුත් පේන්ඩ නැති පාළු පැත්තකට, ගිහිං ඇඳුම් ඔක්කොම ගලවනවා..... දන්නව ද ඊළඟට මොකද වෙන්නෙ කියලා.....? නෑ ඔබ හිතපු දේ නෙමේ වෙන්නේ. අපි ඇඳුම් මාරු කරලා ආයේ ඇඳගන්නවා. මේ වැඩෙන් අපි අපේ හෙළුවැල්ල හොඳට දැකගත්තා. මං හිතන්නේ ඒ වයසෙ දී උනත් ඒක බොහොම ස්වාභාවික දෙයක්. කොහොම උනත් ජෝ මගේ ගවුම ඇඳගෙන මං එයාගේ කලිසම ඇඳගෙන ඉඳීම අපිට හරි ම විනෝදයක් වුණා. මෙහෙම ටිකක් කල් මේ වැඩේ කරන කොට මේ ඕනම ඇඳුමක් අපි දෙන්න ගෙන් ඕනෑ ම කෙනෙකුට ගැළපෙනවා කියලා අපිට හිතුණා. ඒත් අපේ වැඩිහිටියෝ පිරිමි ගෑනු ඇඳුම් මාරු කරලා අඳින් නෑ කියලා අවවාද කළා. මෙහෙම එකට අපි වැඩෙන්න ගත්තා. අපට ලැබෙන හැම දෙයක් ම බෙදාගැනීමේ අවශ්‍යතාවක් ඇති වෙලා තිබුණා. පේර ගෙඩියක් චොකලට් එකක් විතරක් නෙවෙයි. අපි දෙන්න ගෙන් කෙනෙකුට උණ හැදුණොත් උණ හැදුණේ නැති කෙනා දුක් වුණා තමන්ටත් උණ හැදුණේ නෑ කියලා. වෙන් වෙන්නට බැරි සම්බන්ධයක් අපි අතරේ ගොඩනැඟෙමින් තිබුණා. කොහොම හරි දැනුම් තේරුම් ඇති වන විට අපි වටහාගත්තා අපි වගේ අයට ලෝකය කියන්නේ පෙම්වතුන් කියලා බව.

**චරිතයඃ කථක (ගැහැණු/පිරිමි)**

**නාට්‍යයඃ ඉන්දික ෆර්ඩිනැන්ඩු ගේ '*කලම්බෝ කලම්බෝ*'**

කථකඃ

අපි දන්නව! ජංගම දුරකථනය ක්‍රියා විරහිත කරගෙන පැයක් දෙකක් ගත කරන්න පුළුවන් කාලයක නෙමෙයි අපි ජීවත්වෙන්නෙ! ඒ නිසා ඔබේ ජංගම දුරකථනය අවදියෙන් තබාගන්න! කවුරු හරි කෙනෙක් රසවින්දනයට බාධාවක් වෙයි කියල ඒක නිදි ගැන්වූවා නම් නැවත ඇහැරවන්න!

හඬන්නට ආසන්නව ඉන්න ඔබේ පුංචි දරුවවත් අරගෙන රඟහලෙන් එළියට දුවයන්න සැරසෙන්න එපා! පවුලේ සැමට එකට සිට නැරඹිය හැකි වීම කෙසේ වෙතත් මේ සිදුවීම් පෙළ පවුලේ හැමෝම එකට ඉඳගෙන නැරඹිය යුතුයි කියන එකයි අපේ යෝජනාව!

කොහොම උනත්, ඔබේ ජංගම දුරකථනයටයි, ඔබේ පුංචි දරුවටයි වඩා ගැලවෙන්න බැරි විදිහට ඔබේ ජීවිතයට මැදිහත් වෙන දේවල් බලමුළුවකට මුහුණ දෙන්නයි දැන් ඔබ සූදානම් වෙන්නෙ!

කවද හරි දවසක ඔබට ඔබවම හම්බ වෙලා තියෙනවද? මුහුණට මුහුණ? ඒ දේ සිද්ධ වෙන්න පුළුවන් මේ රඟහල ඇතුලෙදි. අනපේක්ෂිතව! ඒ කියන්නෙ මේක එක්තරා විදිහක අනතුරුදායක හැන්දෑවක්. මෙතනදි මුහුණට මුහුණ මුණගැහෙන්න නියමිතයි. වෙන්න කැමැති ඔබ සහ වෙලා ඉන්න ඔබ! ඒ කියන්නේ ඔබ සහ ඔබේ අනෙකා! මේ රූප දෙක එකක් මත එකක් වැටිල එක රූපයක් අතරින් අනික පේන්න පටන් ගත්තම තමයි අවුල පටන් ගන්නෙ!

ඔබට ඔබේ අනිකව පේන කොට දැනෙන කාලකන්නි, මුස්පේන්තු අසනීප ගතිය! එක අතකට ඔබ හිතුවට ඔබ ඔබේ අනෙකා දිහා බලා ඉන්නව කියල ඇත්තටම වෙන්නෙ ඔබේ අනෙකා ඇවිත් ඔබ දිහා බලා ඉන්න එක! කොහොම හරි කමක් නෑ! මෙච්චර කල් කළා වගේ, ඔබට සිද්ධ වෙන දේවල් ඔබට නෙවෙයි වගේ හිටපු පළපුරුද්ද පාවිච්චි කරල මේක විඳ දරා ගන්න!

**චරිතයː වොං (ගැහැණු/පිරිමි)**

**නාට්‍යයː බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ගේ *'The Good Woman of Setzuan'***

**පරිවර්තනයː 'සෙට්සුවානයේ සත්‍යාංගනාවී' විජිත ගුණරත්න**

**සෙට්සුවාන් නගරයේ වීථියක්**

(වතුර වෙළඳම් කොට දිවි රැකගන්නා වොංගේ කට හඬ ඇසෙයි. මොහොතකින් ඉදිරියට එන ඔහු තමාව ප්‍රේක්ෂකයින්ට හඳුන්වා දෙයි.)

වොං : වතුර ගනිල්ලා ............ වතුර ගනිල්ලා............ වතුර........ගනිල්ලා ............. මං තමයි වොං. සෙට්සුවාන් නගරේ මිනිස්සුන්ට වතුර විකුණලයි මම ජීවත් වෙන්නෙ. නියං කාලවල කකුල් දෙක ගෙවෙනකං වතුර හොයාගෙන යනවා. මේක කෙරුවා කියල මට මහ ලොකු ආදායමක් ලැබෙන්නෙත් නැහැ. මොකද මේ මුළු නගරෙම පාලනය වෙන්නෙ දුප්පත් කමින්නෙ. හැම කෙනෙක්ම හිතාගෙන ඉන්නෙ මේ දුප්පත්කම නැති කරන්න පුළුවන් දෙවියන්ට තමයි කියල.... අර මස් කඩේට හරක් හොය හොයා හැම තැනම කරක් ගහන හාදයෙක් කියන කතාවක් මටත් ඇහුණා. හොඳ කෙරුම්කාර දෙවියො කට්ටියක් මග එනවලු..... කතාවෙ හැටියට සමහර විට, අද හෙට මෙහෙටත් එන්න බැරි කමක් නැහැ. හැදිච්ච නැහැදිච්ච ක්‍රියාවල් හින්දා දෙවියන්ගෙ පාණ්ඩුකම්බල ශෛලාසනය රත්වෙලාලු..... පසුගිය දවස් දෙක තුනෙත් මම මේ නගරයට ඇතුළුවෙන මේ දොරටුව ළඟ ඉඳගෙන තමයි වතුර විකුණුවේ. වතුර විකිණිල්ල කොහොම උනත්, අඩු තරමේ අද දෙවියන්ගෙ මුහුණුවත් බලාගන්න පුළුවන් වෙයි. අපි බලමු. ( වොං ඕනෑකමින් අවට පරික්ෂාකාරීව බලයි.) ආ.... කවුද අර කට්ටිය....? නැහැ නැහැ..... ඒ නං ඒගොල්ලෝ වෙන්න බැහැ. ඒ වැඩ ඇරිලා යන කට්ටියක්. අර අතේ තීන්තත් ගෑවිලා. දෙවියෝ තනියම එයිද? ආ....! අතන තවත් දෙන්නෙක්? පුහ්..... එන්නෙ හරියට ගහන්න වගේ. අර අතන තුන් දෙනෙක්? ඒ තුන්දෙනා පෙනුමෙන් අනික් අයට වැඩිය වෙනස්. පරණ තාලෙ ඇඳුම්..... ඇඟ පුරා දූවිලි.... සෑහෙන දුරක් ඇවිදගෙන එන අය වගේ. ඔව් ඒ, ඒ ගොල්ලෝ තමයි. (වොං තරමක් ඉදිරියට යයි.) මොනවද මගෙන් ඉෂ්ඨ වෙන්න ඕනෑ?

(දෙවියන්ට වතුර බීමට දෙමින්) මම දැනගෙන හිටිය ඔබ තුමන්ලා එන බව. මේ මුළු නගරෙම සැදී පැහැදී ඉන්නෙ ඔබතුමන්ලා වෙනුවෙන්.

**චරිතය: ට්‍රොෆිමොෆ් (පිරිමි)**

**නාට්‍යය: ඇන්ටන් චෙකොෆ් ගේ *The Cherry Orchard'***

**පරිවර්තනය: 'චෙරි උයන' රන්ජිත් ධර්මකීර්ති**

ට්‍රොෆිමොෆ්: මුළු රුසියාවම අපේ වත්ත තමයි. ඔයාගේ අත්ත, මුත්තා පරම්පරාවේ හැමකෙනෙක්ම, වහල් හිමියො වෙලා හිටියා. ඒගොල්ලො ජීවත් වෙන මිනිස්සුන්ගෙ අයිතිකාරයො වෙලා හිටියා. ඔය චෙරි උයනෙ තියෙන හැම ගහකින්ම, හැම කඳකින්ම, හැම අතුරිකිල්ලකින්ම ඒ මිනිස්සුන්ගේ මූණු ඔයා දිහා බලාන ඉන්නවා වගේ පේන්නේ නැද්ද? ඔයාලා කවදාවත් මේ ගෙයි හතර මායිමටවත් වද්ද ගත්ත නැති මිනිස්සුන්ගේ ලේ මස් නහරින් ඔයගොල්ලෝ ජීවත් වෙනවා කියලා. අපි අඩුගානෙ කාලයට වඩා අවුරුදු 200 ක් වත් පිටිපස්සෙන් ඉන්න මිනිස්සු ජාතියක්. අපි ලබාගත්තු කිසිම ජයග්‍රහණයක් නෑ. ආන්යා ඔයාට මං මේ කියන කාරණය තේරෙනවද?

ඔයා එහෙම මේ ගෙදර යතුරු පොදි ගහගෙන ඉන්නව නම් ඒව අර ළිඳට විසිකරලා දාලා මෙතනින් පිටවෙලා යන්න. හරියට හුළඟ වගේ නිදහසේ ජීවත්වෙන්න. ආන්යා මාව විශ්වාස කරන්න. මට තාම අවුරුදු 30 ක් වෙලාවත් නෑ. මම තාම තරුණයෙක්. තාමත් ශිෂ්‍යයෙක්. ඒත් මම මේ ඩිංගට කොයිතරම් දුක් විඳලා තියෙනවද? ආන්යා සතුට අපට ළංවෙන බව මට දැනෙනවා. සතුට අපි දිහාට එනවා වගේ මට පේනවා.

වාර්යා බයයි අපි දෙන්න හිටි හැටියෙම ප්‍රේම කරන්න පටන් ගනීවි කියලා. එයාගේ පටු මොළයට වැටෙන්නේ නෑ අපි දෙන්නා අතරේ තියෙන්නේ ආදරේට වඩා උතුම් සම්බන්ධයක් බව. ඉදිරියටම යමු... අර ඈත දිලිසෙන දීප්තිමත් තාරකාව දිහාවට අපි නොනැවතී ඉදිරියට ගමන් කරනවා... ඉදිරියටම යමු. පසුබට වෙන්න එපා.

**චරිතය : අසංග (පිරිමි)**

**නාට්‍යය: රාජිත දිසානායක ගේ *'සිහින හොරු අරං'***

(ජයසුමන හා වසන්තිට)

අසංග : මම වැරදි ද හරි ද කියන දේ නෙවෙයි මට වැදගත්. මගේ ජීවිතේ ආපස්සට හරවා ගන්නෙ නැතිව ඉස්සරහට ගෙනියන්න ඕන හයිය හොයා ගැනීම විතරයි මට වැදගත්. මගේ ඉස්සර ආසාව තිබුණෙ මේ මං වගේ කෙනෙක් වෙන්ඩ නෙවෙයි. ඒ උනාට මට දැන් වෙන විදිහක් නෑ ජීවත් වෙන්ඩ. අනික මේ රටේ මිනිස්සු ඉදිරියේදී තීරණය කළොත් මං මේ ගෙවන ජීවිතේ දිගටම ඉස්සරහට ගෙනියන්න ඕනා කියලා අයෙ ඒක වෙනස් කරන්ඩ ඒගොල්ලන්ට වත් මටවත් ලේසි නෑ. මං ඔය දෙන්නට කියන්නෙ මෙච්චරයි. ඊයෙ පොලිස් කූඩුවෙ නිදියලා අද ගෙදර නිදියන්න චාන්ස් එක තියෙන කොට ආයෙ හෙට පොලිස් කූඩුවේ නිදාගන්න හිතන්න එපා. දෙන්නා අද ගෙදර ගිහින් සන්තෝසෙන් නිදාගෙන හෙට උදෙන්ම ආයේ එන්න මාව හම්බ වෙන්ඩ.

(අසංග වසන්ති දෙස බලා සිනාවක් පළ කරයි.)

අසංග : එහෙම නං සුභ ගමන් දෙන්නාටම

(ජයසුමන හා වසන්ති පිටව යන්නට සැරසෙයි.)

අසංග : පොඩ්ඩක් ඔහොම නවතින්න. (ජයසුමනට) ඔයා රස්සාවට කරන්නෙ තුවක්කුව කරේ දාගෙන ඉන්න එක විතරක් නෙමෙයි නේ ද? අණක් හම්බ උනාම වෙඩිතියන්නත් තමා ලෑස්තිවෙලා නේද ඉන්නෙ? මං විහිළුවක් කළේ. හෙට උදේ හම්බ වෙමු.

(ජයසුමන හා වසන්ති පිටව යති.)

අසංග : (ප්‍රේක්ෂකයන්ට)

අර මිනිහා ගිය විදිහ මට ඇල්លුවෙ නෑ. ඔයගොල්ලන්ට හිතෙන් නැද්ද මිනිහා දැන් යන ගමන්, මගේ බොඩිගාඩ් කෙනෙක්ගෙ තුවක්කුවක් උදුරගෙන, ගැනිටත් වෙඩි තියලා මිනහත් වෙඩි තියා ගනියි කියලා. එහෙම නැත්තං විරුද්ධ පක්ෂයත් එක්ක සෙට් වෙලා මට වැඩක් දෙන්න හදයි ද? නැත්තං මිනිහා හෙට ඉඳන් මං ළඟ මගේ මිනිහෙක් විදිහට අලුතින් ඉපදෙයි ද?

**Character: Abigale (Female)**
**Play The Crucible by Arthur Miller**

ABIGAIL:
Why, you taught me goodness, therefore you are good. It were a fire you walked me through, and all my ignorance was burned away. It were a fire, John, we lay in fire. And from that night no woman dare call me wicked any more but I knew my answer. I used to weep for my sins when the wind lifted up my skirts; and blushed for shame because some old Rebecca called me loose. And then you burned my ignorance away. As bare as some December tree I saw them all—walking like saints to church, running to feed the sick, and hypocrites in their hearts! And God gave me strength to call them liars, and God made men to listen to me, and by God I will scrub the world clean for the love of God. Oh John, I will make you such a wife when the world is white again! You will be amazed to see me every day, a light of heaven in your house, a…..Why are you cold?!

**Character: Tom (Male)**
**Play: The Glass Menagerie by Tennessee Williams**

TOM:
I didn't go to the moon. I went much further–for time is the longest distance between two places. Not long after that I was fired for writing a poem on the lid of a shoebox. I left St. Louis. I descended the steps of the fire escape for a last time and followed, from then on, in my father's footsteps, attempting to find in motion what was lost in space. I traveled around a great deal. The cities swept about me like dead leaves, leaves that were brightly coloured but torn away from their branches. I would have stopped, but I was pursued by something. It always came upon me unawares, taking me altogether by surprise. Perhaps it was a familiar bit of music. Perhaps it was only a piece of transparent glass. Perhaps I am walking along a street at night, in some strange city, before I have found companions. I pass the lighted window of a shop where perfume is sold. The window is filled with pieces of coloured glass, tiny transparent bottles in delicate colours, like bits of a shattered rainbow. Then all at once my sister touches my shoulder. I turn around and look into her eyes. Oh Laura, Laura, I tried to leave you behind me, but I am more faithful than I intended to be! I reach for a cigarette, I cross the street, I run into the movies or a bar, I buy a drink, I speak to the nearest stranger–anything that can blow your candles out! For nowadays the world is lit by lightning! Blow out your candles, Laura – and so goodbye…

# සහතික පරීක්ෂාව සඳහා ඇගයුම් නිර්ණායක

| පරීක්ෂණය සිදු කරන ක්‍රමවේදය | ඇගයීම් නිර්ණායක | ඇගයීම් විස්තරය | ලකුණු ලබාදීමේ ක්‍රමවේදය | ලකුණු |
|---|---|---|---|---|
| සහතික පත්‍ර පරීක්ෂාව | විද්‍යාර්ථීන්ගේ ජාතික, අන්තර්ජාතික ජයග්‍රහණ සහ රජය පිළිගත් සය මසකට නොඅඩු වූ පාඨමාලාවලින් ලබා ගත් ඇගයීම | ජාතික, අන්තර්ජාතික වශයෙන් ලබාගත් විෂයානුබද්ධ සහ වෙනත් ජයග්‍රහණ හෝ රජය පිළිගත් ආයතනයකින් සය මසක් තුළ අවසන් කළ පාඨමාලා පිළිබඳ සංක්ෂිප්ත තොරතුරු විශ්වවිද්‍යාලය විසින් ඔබට ලබා දෙන ලද ආකෘති පත්‍රය අනුව ඉදිරිපත් කරන්න.<br><br>ඔබ විසින් උසස් පෙළ හදාරන ලද වර්ෂයේ සිට පෙර වසර තුනක් ඇතුළත හෝ උසස් පෙළ විභාගයට ඉදිරිපත් වීමෙන් අනතුරුව දිනාගත් පදක්කම්, සම්මාන සහ සහතික පත්‍ර පමණක් ඇගයීමට ලක් කෙරේ. | අන්තර්ජාතික මට්ටමේ ජයග්‍රහණ (ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන සහ සහභාගි වීම) | 03 (එකකට ලකුණු 03 බැගින්) |
| | | | ජාතික මට්ටමේ ජයග්‍රහණ | |
| | | | ප්‍රථම ස්ථානය | 02 (එකකට ලකුණු 02 බැගින්) |
| | | | දෙවන ස්ථානය | 01 (එකකට ලකුණු 01 බැගින්) |
| | | | තෙවන ස්ථානය | 0.5 (එකකට ලකුණු 0.5 බැගින්) |
| | | | උසස් ඩිප්ලෝමා (එක් අවුරුදු හෝ ඊට වැඩි) | 02 (එකකට ලකුණු 02 බැගින්) |
| | | | ඩිප්ලෝමා (සය මාසික හෝ වැඩි)<br><br>(ජාතික නැටුම්, නාට්‍ය, සංගීත විභාගය අවසාන සහතිකය, භාත්කණ්ඩ සංගීත, නැටුම් විභාගය විශාරද සහතිකය) | 01 (එකකට ලකුණු 01 බැගින්) |